# මැයි එකොලහ කළුවර රෑ

විභාග සමත් කළ හැකි උගතුන් වූ පමණින් ම කිසිවකු බුද්ධිමතෙකු නොවන බව අප කවුරුත් අසා පුරුදු කියමනකි. අහන්නන් වාලේ මෙය අසා තිබෙන නිසාම අදහනු වෙනුවට එහි නිවරද තේරුම අත්දැකුමෙන් ම මනා ලෙස අවබෝධ කරගන්නට අවශ්‍ය නම්, ඒ සඳහා ඇති ප්‍රත්‍යක්‍ෂතම මාර්ග ය වන්නේ උසස් පෙල විභාගය සමත් වී ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල වලට ඇතුලත් වන පිරිස් පිළිබඳ සමාජ සමීක්‍ෂණයක් කර බැලීමයි. ඉහත කියමන සනාථ කරවන උදාහරණ සපයන්නෝ විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් පමණක් නොවේ. එහි ඇදුරෝ ද, තම සැබෑ බුද්ධි මට්ටම ප්‍රදර්ශනයේ ලා ඉමහත් දක්‍ෂයෝ ය.

මේ නිසා ම විශ්ව විද්‍යාලීය සමාජය, රටේ පොදු සමාජයේ නිවැරදි පැතිකඩක් නිරූපනය කෙරේ යැයි ඉඳුරාම කිව හැකිවේ. බුද්ධිමතුන් මෙන්ම මන්දබුද්ධිකලා ද, ඥාණවන්තයින් මෙන්ම මහදැණමුත්තෝ ද, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ මෙන්ම සියල්ල දත්තෝ ද, ඒ සමගම සිංහයෝ මෙන්ම සිංහ වෙස්ගත් සිගාලයෝ ද රටේ ප්‍රතිශතයන් ට නොඅඩුව විශ්ව විද්‍යාලවල ද වෙසෙති. ඉදින්, රටේ කෙරෙන නොපනත් කම් ඒ අයුරින්ම විශ්ව විද්‍යාලය තුල ද සිදුවීම අරුමයක් නොවේ. එසේම, විශ්ව විද්‍යාලයේ සිටින්නෝ විභාග සමත් වූවෝ වන නිසා, සමහර විට රටේ යම් නොපනත් කමක් වීමට පෙරාතුව ම එය කිරීමට සහ හැකිනම් එය ඊටත් වඩා තිරශ්චීන ලෙසින් කිරීමට, ඔවුන් සමත් වනු ඇත.

මේදිගුහැඳින්වීමත්සමගමමාසැරසෙන්නේ, 1983 කළු ජුලියට පුරෝධාවකයක් වෙමින් ඊට මාස දෙක හමාරකට පෙර පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ සිදුවූ අශෝභන, තිරශ්චීන සිදුවීම් කිහිපයක් සහ ඒ සම්බන්ධ වෙනත් කරුණු, මේ පිළිබඳව උනන්දුවක් දක්වන්නන් ගේ දැන ගැනීම පිණිස සටහන් කිරීමටයි.

අවට පරිසරය, තුරු ලතා, ගොඩනැගිලි යනාදිය ගැන සලකන කල පේරාදෙනිය විශ්ව විද්‍යාලය ශ්‍රී ලංකාවේ විශ්ව විද්‍යාල අතර අසමසම වේ. එයට තවත් හේතුවක් වන්නේ, පේරාදෙනිය නේවාසික විශ්ව විද්‍යාලයක් වීමයි. උතුර, දකුණ, වම, දකුණ යනාදී රටේ සැම දිශාවකින් ම පැමිණි ශිෂ්‍යයෝ, වචනයේ සැබෑ අරුතෙන් ම එක හැළියේ බත් කමින් තුන් හතර වසරක් මෙහි ජීවත්වෙති. ඔවුන් ගේ වාසය සඳහා අරුනාචලම්, රාමනාදන්, හිල්ඩා ඔබේසේකර, අක්බාර්-නෙල් යනාදී පුද්ගල නාමයෙන් නාමාභිෂේක කොට තිබූ, නේවාසිකාගාර ශාලා යනුවෙන් පොදුවේ හැඳින්වෙන සුවිසල් මහල් ප්‍රාසාද තනවා තිබේ. ඒවා ද, ඊට අමතරව ගොඩනගා තිබෙන සනාතන මන්දිරය ඇතුළු වෙනත් පොදුකාර්ය විශ්ව විද්‍යාල ගොඩනැගිලි ද, පීඨ ගොඩනැගිලි සංකීර්ණයන් ද යනාදිය, ඓතිහාසික සිංහල ගෘහ නිර්මාණ ලක්‍ෂණයන් විදහා දක්වන පරිදි මනා නිමැවුමකින් යුතුව සාදන්නට හැකිවී ඇත්තේ කොරියන් යුද්ධයේ අතුරු පලයක් ලෙසින් රබර් මිල ඉහල යාම නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය සවිමත්ව තිබූ සමයක එවකට කොළඹ තිබූ ලංකා විශ්ව විද්‍යාලය පේරාදෙනියට ගෙනියන්නට පිඹුරුපත් සැකසුනු නිසා බව නොරහසකි.

පරිසරයේ සොඳුරු බව කෙසේ වූව ද, පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍ය ජීවිතය නම් දුෂ්කර වූ ද, කටුක වූ ද එකක් බව නන්දු මාලිනිය ගැයූ සුනිල් ආරියරත්න ගේ "හන්තාන අඩවියේ - ප්‍රේමයේ සුවඳ නොවේ" පදමාලාවෙන් මොනවට කියැවේ.

පුරා සිව් වසරක් ඒ හන්තාන අඩවියේ මා ගත කළ දිවියෙන් මගේ ජීවිතයට වූ යහපත කුමක්දැයි කිසිවෙකු මගෙන් විමසුව හොත් මා දෙන උපහාසාත්මක පිළිතුර නම්, ඒ වෙන කිසිවක් නොව අක්බාර්-නෙල් ශාලාවේ භෝජනාගාරයෙන් කොල ගෝවා මැල්ලුම, මුං ඇට හොදි සහ මස් බොර සමග ලොකු ඇට හාලේ බත් රස ගුණ නොබලා ගිල දැමීම නිසා දශක දෙකකට පසුවත් අදත් මට ඕනෑම කුණු ගොඩක් ගිල නොවමාරා දිරවා ගන්නට ඇති හැකියාව බවයි.

ඒ සරදම් කෙසේ වෙතත්, මගේ පේරාදෙනිය සිව් වසරක ජීවිතයෙන් මා ලැබූ වටිනාම අත්දැකුම වන්නේ උතුරෙන්, නැගෙ නහිරෙන් පැමිණි දෙමල සිසුන් ඇසුරු කිරීමට ලැබීමයි. අපේ ඉංජිනේරු පීඨ කණ්ඩායමේ දළ වශයෙන්, සිංහල සිසුන් 125 ක් පමණ ද, ද්‍රවිඩ සිසුන් 100 ක් පමණද, මුස්ලිම් සිසුන් 25 ක් පමණ ද වූහ. ඒ දෙමල, මුස්ලිම් සිසුවෝ ද මා කලින් සඳහන් කළ ලොකු ඇට හාලේ බත් ගෙඩි ගෝවා කොල මැල්ලුම සමග කෑහ. එසේ හෙයින්, අප වචනයේ අර්ථ පරිසමාප්තාර්ථ යෙන් ම එක හැලියේ බත් කෑ අය වෙමු. මේ නම් මා මහත් භාග්‍යයක් කොට සළකන සුවිශේෂ වූ අත්දැමීමක් ම විය. එය මා පාසැල් සමයේ දී සිංහලෙන් කතා කළ බෞද්ධ දෙමල සිසුවෙකු වූ කුමාර් සමග කළ ඇසුරෙන් ලද අත්දැකීම් වලට වඩා සැම අතින්ම වෙනස් එකක් විය.

උතුරු-නැගෙනහිරෙන් පැමිණෙන සිසුවෝ අති මහත් බහුතරයක් සිංහල බස ලිවීම, කියවීම හෝ කතා කිරීම හෝ හසරක් නොමදැන පේරාදෙනියට පැමිණෙති. සමස්ත සිංහල සිසු පිරිසම එලෙස ම දෙමල බස ලිවීම, කියවීම හෝ කතා කිරීම හෝ හසරක් නොමදැන එහි පැමිණෙති. අපේ සන්ධාන භාෂාව වන්නේ, පීඨයේ උපදේශක භාෂාව ද වන ඉංගිරිසියයි. පේරාදෙනියේ වාසය කිරීමට ලිවීම කෙසේ වෙතත්, සිංහල තරමක් කතා කරන්නටත්, බස් රථ පුවරුවක් වත් කියවා ගන්නට හැකි තරමට සිංහල කියවීමේ දැනුමකුත් අවශ්‍යවේ. නවක සිසුන් සැම දෙන සඳහා ඉංගිරිසි පිළිබඳව කඩිනම් පාඨමාලා පැවැත්වෙන අතර ක්‍රමවත් වැඩ පිළිවෙලක් නොතිබුන ද නවක දෙමල සිසුන් ට ජ්‍යෙෂ්ඨ දෙමල සිසුන් විසින් කඩිනම් සිංහල කතාබහ පාඨමාලා සංවිධානය කෙරේ. මේ අතර තුර සිංහල දෙමල සිසුන් දෙපිරිස අතර කතාබහ, මුලදී කණ්ඩායම් පැවරුම් විද්‍යාග ාර ක්‍රියාකාරකම් වැනි අත්‍යාවශ්‍ය අධ්‍යාපනික කරුණු අරභයා ද, පසුව ඊට අමතරව විහිළු තහළු සහ අනෙකුත් සමාජමය කරුණු අරඹයා ද, බැරි බැරි ගාතේ ඉංගිරියෙන් පටන්ගෙන පසුව ඉංගිරිසියෙන් සහ හැකි පරිදි සිංහලෙන් ද සිදුවීම ඇරඹේ . මේ හේතුවෙන් දෙපිරිස අතර අන්‍යෝන්‍ය අවබෝධයක් මෙන්ම සුහදතාවයක් ද ඇතිවේ. මෙය නම් වෙන කිසි තැනෙක නොලැබෙන සැබෑ භාග්‍යයකි.

අපේ පීඨයේ වැඩි ශිෂ්‍ය දේශපාලනයක් නොතිබුණි. ඒ කෙසේ වෙතත්, දෙමල සිසුවෝ මේ අරභයා අනුගමනය කළේ නිශ්ක්‍රීය පිළිවෙතකි. එයට හේතුව සරලය. අපේ තාත්තලාගේ කාලයේ යම් ප්‍රගතිශීලි අදහසක් දැරුවෙක් වෙත්නම් ඔහු සමසමාජ කාරයෙක් සේ හංවඩුගැහුනා සේම, අපේ කාලයේ යම් සමාජ ප්‍රතිගාමී ක්‍රියාවන් ට විරෝධතාවයක් දැක්වූයෙක් වූයේ නම් ඔහු ජේවීපී කාරයෙක් වූවා සේම, එවැන්නෙක් දෙමල වූයේ නම්, ඒ ප්‍රාග් 1983 සමයේ පවා ඔහු එල්ටීටීඊ කාරයෙක් බවට සැකයට භාජනය වන්නට ඉඩ තිබුණු බව දෙමල සිසුන් හොඳින් දැන සිටින්නය ඇත. පසුව මා විස්තර කරන්නට අදහස් පරිදි සිදුවුනේ ද එයයි.

අප ඒ සුන්දර පේරාදෙනි පරිසරයේ, අන්තර් ජනවාර්ගික සාමකාමී සහජීවනයේ යෙදෙමින් සිටි මේ සමයේ උතුරේ සටන, එහි මූලික හේතුව වූ ජනවාර්ගික ප්‍රශ්ණය යටපත් කරමින්, බිම්බෝම්බ රැගත් දෙමල ත්‍රස්තවාදයෙන් ද, පුස්තකාල ගිනිතැබීම්, අතුරුදහන් වීම් යනාදිය පෙරටු කොට ගත් රාජ්‍ය ත්‍රස්තවාදයෙන් ද, ඉන්ධන ලබමින් හොඳින් ගිනිගන්නට පටන් ගෙන තිබුණි. මෙසේ කාලය ගත වෙද්දී, මගේ මේ ලිපියට උදෘත වී ඇති මැයි 11 දිනය උදාවිය.

බුද්ධිමතුන් පරදා මන්දබුද්ධික ලා රජ වූහ. ඥාණවන්තයන් වෙනුවට මහදැනමුත්තෝ උපදේශක ලා වූහ. සිංහයන් වෙනුවට සිංහ වෙස්ගත් සිගාලයින් පෙරට ආහ. සමස්ත විශ්ව විද්‍යාල ශිෂ්‍ය සංහතියටම නින්දා කෙරිණ. පේරාදෙනිය විශ්ව විද්‍යාල ඉතිහාසයේ නොමැකෙන කැළලක් ඇතිවිය. සැලසුම් සහගතව කෙරුනා යැයි සැක සිතෙන තරමට සූක්‍ෂම ලෙස කුඩා පිරිසක් විසින් අරඹන ලදුව, ඔවුන් ගේ උසිගැන්වීමෙන්, සිංහල සිසුවෝ පිරිසක් විසින් දෙමල සිසුන් කිහිපදෙනෙකුට පහර දුන්නහ. නීති විරෝධී ලෙස අත් අඩංගුවට ගෙන පොලීසියට බාර දුන්නහ. මැයි එකොලහ රුය කැලි කැපිය හැකි ගණඳුරෙන් යුතු තිත්ත කළුවර රැයක් විය.

මෙහි දී කැපී පෙනෙන සිදුවීමක් වූයේ, මේ තිරශ්චීන සිදුවීම් මාලාව ගැන, සාක්ෂි මත පදනම්ව, ලියවී ඇති ලිපිවලට අනුව, විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් ට නිසි මග පෙන්වීමට සිටි ආචාර්ය මහාචාර්යවරුන් ඇතමෙක්, එසේ උපදෙස් දීම කෙසේ වෙතත්, මේ අමානුෂික ක්‍රියාවලට වක්‍රාකාරයෙන් හෝ සහය දීමයි. තම ආරක්‍ෂාව පිළිබඳ බැරෑරුම් ප්‍රශ්ණ මතුවීම නිසා බියට පත් දෙමල සිසුවෝ පසුවද ම විශ්ව විද්‍යාලය අතරහැර තම ගම් බිම් බලා ගියහ.

මැයි එකොලහ කළුවර රෑ ආමනුෂික සිද්ධීන් පිළිබද වැඩි විස්තර මා මීලඟ කලාපයෙන් ඉදිරිපත් කිරීමට අදහස් කරමි. මේ සිද්ධීන් හා සම්බන්ධයෙන් එතෙක් කිව යුතු ධනාත්මක කරුණු දෙකක් ඇත.

මින් පළමුවැන්න නම්, නිවෙස් බලා ගිය තම දෙමල සගයින් ගේ ආරක්‍ෂාව තහවුරු වී ඔවුන් යළි විශ්ව විද්‍යාලයට පැමිණෙන තෙක්ම, ඉංජිනේරු පීඨ ශිෂ්‍ය සංගමයේ පැසසුම් සහගත දුරදර්ශී නායකත්වය යටතේ, ඉංජිනේරු සිසුන් දේශණ සහ අනෙකුත් අධ්‍යාපන කටයුතු වලට සහභාගී වීමෙන් වැලකී සිටි බවයි. උගතුන් අතර බුද්ධිමතුන් ද, මහදැණමුත්තන් අතර ඥාණවන්තයින් ද සිටිනා බව මට පසක් විය.

දෙවැන්න නම්, එදා දෙමල සිසුන්ට අඩන්තේට්ටම් කිරීමට ගිය මැරයන් ගැයූවායැයි පැවසුනු "කඩුවක් ඇවැසි තැන කඩුවක් ගෙන නැගෙනු" යනාදී ජාතිවාදීන්ට උඩ ගෙඩි සැපයෙන ගීත නිර්මාණයෙන් සුනිල් ආරියරත්නයෝ ද, නන්දා මාලිනිය ද ඉන් පසු සහමුලින් ම වැලකුණු බවයි. ඔහු ඉන් පසු ලියූවේ, ඇය ඉන්පසු ගැයූවේ, "උරය පලා සැතකින් බලන් රුහිරු, එක රතු පැහැයෙන් ගලා හැලෙන අයුරු" වැනි ගීත ය.

මින් මාස දෙකහමාරක් ගතවෙන්නටත් පෙරාතුව කුප්‍රකට කළු ජූලිය එලැඹින. ඒ නරුම දේශපාලන ප්‍රවාහය මදක් අත් විඳ සැලීගිය සිතකින් යුතුව මා ලියූ පහත කවෙන් මේ මැයි එකොළහ කළුවර රෑ ලිපියේ පළමුවන කොටස අවසන් කරමි.

ජාතිවාදයේ බිරුසන් හඬ මැද
සමාජවාදය සැඟවී ගිය සඳ
සහෝදරත්වයෙ සළුපට ගිලිහිණ
අමානුශිකත්වයෙ නිරුවත හෙලිවිණ

මැයි එකොළහ කළුවර රෑ ලිපියේ දෙවන කොටසින් යළි හමුවෙමු.

*ර. චන්ද්‍රසූරිය*



> බුද්ධිමතුන් මෙන්ම මන්දබුද්ධිකලා ද, ඥාණවන්තයින් මෙන්ම මහදැණමුත්තෝ ද, බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තෝ මෙන්ම සියල්ල දත්තෝ ද, ඒ සමගම සිංහයෝ මෙන්ම සිංහ වෙස්ගත් සිගාලයෝ ද රටේ ප්‍රතිශතයන් ට නොඅඩුව විශ්ව විද්‍යාලවල ද වෙසෙති. ඉදින්, රටේ කෙරෙන නොපනත් කම් ඒ අයුරින්ම විශ්ව විද්‍යාලය තුල ද සිදුවීම අරුමයක් නොවේ. එසේම, විශ්ව විද්‍යාලයේ සිටින්නෝ විභාග සමත් වූවෝ වන නිසා, සමහර විට රටේ යම් නොපනත් කමක් වීමට පෙරාතුව ම එය කිරීමට සහ හැකිනම් එය ඊටත් වඩා තිරශ්චීන ලෙසින් කිරීමට, ඔවුන් සමත් වනු ඇත.